Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මොඩියුල අංක 03

## ශ්‍රී ලං.ගු.සේ.3-1 ගුරුවරුන් සඳහා




# පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍යයා හඳුනා ගැනීම

# අරමුණු

- කළමනාකරණ සංකල්ප නිර්වචනය කර එළදායී පන්තිකාමර කළමනාකරණ ක්‍රියාවලිය විස්තර කරයි
- පන්ති කාමර ව්‍යවහාරයන් ගුරු-සිසු දෙපිරිසටම ප්‍රිය උපදවන පරිදි භාවිතා කරයි
- විවිධ වයස් කාණ්ඩයන්ට අයත් සිසුන්ගේ ගති ලක්‍ෂණ හඳුනා ගනී
- ළමයා හා පරිසරය ළමා වර්ධනය අවශ්‍යතා අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රමවේද භාවිතා කරයි
- පන්ති කාමරය තුළ මතු වන සිසුන්ගේ අභියෝගාත්මක චර්යාමය ගැටලු කළමනාකරණය කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ඉගෙනුම් ඵල

- පන්ති කාමර කළමනාකරණය යනු කුමක් දැයි පැහැදිළි කරයි
- කළමනාකරණ ක්‍රියාවලිය විධිමත්ව පන්ති කාමර කටයුතුවල දී භාවිත කරයි
- පන්ති කළමනාකරුවෙක් වශයෙන් කාර්යක්‍ෂමව හා ඵලදායීව කටයුතු කරයි
- සිසුන්ගේ මතුවන චර්යා ගැටලු අවස්ථාවෝචිත පරිදි කළමනාකරණය කරයි
- පන්ති කාමරයේ දී හමුවන සිසුන් චර්යාමය විවිධතා අනුව හඳුනා ගනී
- සිසු විවිධතාවලට ගැලපෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්‍ෂම ලෙස මෙහෙයවයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අන්තර්ගතය

- පන්ති කාමර කළමනාකරණය නිර්වචනය හා එහි අවශ්‍යතාව
- පන්ති කළමනාකරණ ක්‍රියාවලිය හැඳින්වීම හා ගුරු නායකත්ව ශෛලීන්
- පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයා
- ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම
- ශිෂ්‍යයා හඳුනා ගැනීම
- ළමා සංවර්ධනය
- ශිෂ්‍යයා හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණ
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කළමනාකරණය යනු

- සංවිධානයක අරමුණු ඉටු කරගැනීම සඳහා එම සංවිධානයේ තිබෙන මානව හා අනෙකුත් සම්පත් සැලසුම් කිරීම සංවිධානය කිරීම මෙහෙයැවීම හා පාලනය කිරීම යන කාර්යයන් ඇතුලත් ක්‍රියාවලිය යි
    - ජ්ටෝනර් ෆ්‍රීමන් හා ගිල්බර්ට් 1990

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පන්ති කළමනාකරණය යනු

- සිසුන් සහිත පන්තියක් මනාව හසුරුවාගෙන යාම පන්ති කළමනාකරණය ලෙස හැඳින්විය හැකි ය. එය පන්ති පාලනයට වඩා වෙනස් වූ පුළුල් කර්තව්‍යයකි. පාලනය යනු කළමනාකරණයේ එක් කාර්යයක් පමණි. එහෙත් පන්ති කළමනාකරණයේ දී සැළසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයැවීම පාලනය, සම්බන්ධීකරණය, ගෘහ පාලනය, පෝෂණය ආදී විවිධ කළමනාකරණ කටයුතු කිරීමට සිදු වේ.
    - ජොන්සන් සහ බෲක් 1997

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පන්ති කළමනාකරණය යනු

- හිතකර චර්යාවන් උපස්ථම්භනය කිරීමෙන් ද අහිතකර චර්යාවන් නිරුද්ධනය කිරීමෙන් ද පන්ති කාමර පරිසරය සක්‍රීය ලෙස පාලනයට නතු කිරීමේ ක්‍රියාවලිය යි
    - ගිබ්සන් 1981

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


# කළමනාකරණ ක්‍රියාවලිය

- ලූතර් ගයුලික් ගේ ආකෘතිය

සැලසුම් කිරීම
↓
සංවිධානය කිරීම
↓
බඳවාගැනීම
↓
මෙහෙයැවීම
↓
සම්බන්ධීකරණය
↓
වාර්තාකරණය
↓
අය-වැයකරණය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කළමනාකරණ ක්‍රියාවලිය



# සැලසුම්කරණය

- අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා අවිනිශ්චිතභාවය සම්බන්ධ ක්‍රියාකාරකම් ගොඩනැගීමේ ක්‍රියාවලිය සැලසුම්කරණය යි
- ඉලක්ක ළඟා කර ගැනීමට මෙ මගින් මග පෙන්වයි
- කළමනාකරණයේ වැදගත්ම ප්‍රාථමික කාර්යය යි
- මෙ මගින් සෙසු කළමනාකරණ කාර්යයන්ට පදනම දමනු ලබයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සැලසුම්කරණ කාර්යය

- අරමුණු පිහිටුවා ගැනීම
- වර්තමාන තත්වය නිශ්චය කිරීම
- අනාගත තත්වයන් පිළිබඳ පුරෝකථනයන් දියුණු කිරීම
- උපකාරී සැළසුම් පිළියෙළ කිරීම
- සැළසුම් ක්‍රියාත්මක කිරම
- ප්‍රතිඵල ඇගයීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සංවිධානකරණය

- පොදු පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් ළඟා කර ගැනීම සඳහා පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් සාමූහිකව එකට වැඩ කිරීමේ ක්‍රියාවලිය සංවිධානය නම් වේ
- පරමාර්ථවලට ළඟා විය හැකි පරිදි සංවිධානයේ සාමාජිකයන් අතර සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලිය ද මීට අයත් වේ
- සංවිධානකරණයේ දී ආයතනයක සෑම පුද්ගලයකු ම අතර අදාළ කාර්ය කොටස හා අධිකාරිය පැවරීම කෙරේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සංවිධානකරණය

- ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයන් සම්බන්ධීකරණය කර ගැනීම හා ඔවුන්ගේ උපරිම හැකියාවන් හා පරිශ්‍රමයන් ලබා ගැනීම/ ද්වි ගණනය වැලැක්වීම/ පුද්ගල කණ්ඩායම් අතර ගැටුම් අවම කිරීම/ සම්පත් නාස්තිය මගහැරවීමට අවකාශ ලැබේ
- ආයතනයක කටයුතුවල මනා සංනිවේදනය හා පාලනය සඳහා සංවිධානකරණය පිටිවහලක් වේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නායකකරණය

- නායකත්වය යනු සංවිධානයක අරමුණු ළඟාකර ගැනීම සඳහා යටත් අයට ඔවුන්ගේ රාජකාරීන් සූදානමින් හැකියාවකින් සහ උනන්දුවෙන් ඉටු කිරීම පිණිස බලපෑම් කිරීමේ කලාව යි
- මෙහි දී අභිප්‍රේරණය කිරීම ද වැදගත් ය
- තනතුරු ඔස්සේ ලැබෙන නායකත්වය විධිමත් නායකත්වය යි
- අන්තර් පුද්ගල සබදතා පවත්වාගෙන යාමේ දී කළ හැකි බලය අවිධිමත් නායකත්වය යි
- සාර්ථක නායකයකු විධිමත් හා අවිධිමත් යන නායකත්වයන් දෙකම ඵලදායී ලෙස භාවිතා කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නායකත්ව ශෛලීන්

- **ඒකාධිපති-** නායකයා විසින්ම පාලනය අධීක්ෂණය තීරණ ගැනීම සිදු කරයි
- **ප්‍රජාතන්ත්‍රවාදී-** සෙසු අයට නිතර උදව් කරන බලතල පවරන නායකත්වයට රුකුල් දෙන නායකයෙකි
- **වන්නාටවාදී-** නායකයා ආයතනයට වඩා තමාගේ ආරක්ෂාව ගැන සිතයි අවම මට්ටමින් කටයුතු කර වගකීමෙන් ගැලවීමට බලයි සොයා බැලීම අනවශ්‍ය යැයි සිතයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පාලනය

- සත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිඵලවලට එකඟබව තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය පාලනය නම් වේ
- ආයතනයේ පරමාර්ථ ඉටු වන ලෙස එහි කටයුතු තහවුරු කර ගැනීම පාලන කාර්යය මගින් සිදු වේ
- නූතන සමාජය පිළිගනු ලබන වැදගත් පාලන ක්‍රමයක් වනුයේ පූර්ණ තත්ව කළමනාකරණය යි

# පාලනයේ දී ඉටු විය යුතු කාර්යයන්

- සම්බන්ධතාවය හා කාලය පිළිබඳව අවධානය යොමු කිරීම
- ආයතනය අපේක්ෂා කරන තත්වයෙන් වෙනස් වීම හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම
- කාර්යඵල පිහිටුවීම
- ප්‍රමිතීන් පිහිටුවීම
- සත්‍ය කාර්යඵල මැනීම
- සත්‍ය කාර්යඵල ප්‍රමිතීන් සමග සැසඳීම
- අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම
- සැලැස්මේ අරමුණු සමග සැසඳීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පාලනය මගින් සංවිධානයට ලැබෙන ප්‍රයෝජන

- කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම
- අඛණ්ඩව ගුණාත්මක බව තහවුරු කරගැනීම
- තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීම
- ඉක්මන් සේවාවක් ලබා ගැනීම
- අගයයන් එකතුකිරීම
- පුද්ගලයන්ගේ කාර්ය සඵලබව මැනගැනීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පාලන වර්ග

- **ඉදිරිපෝෂණ පාලනය-** ගැටලු ඇතිවීම වැලැක්වීම සඳහා පියවර ගැනම
- **සහගාමී පාලනය** - දැනට සිදුවන කටයුතු හා ක්‍රියාවලීන් සැලසුම් කිරීම
- **පසුපෝෂණ පාලනය-** විචලතාවන් හඳුනා ගැනීමෙන් පසු හේතු සොයා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයා හඳුනා ගැනීමේ වැදගත්කම

- සියදිවි නසාගැනීම
- වරදකරුවන්ලෙස නීතියට හසුවීම
- පාසල් මාරු කිරීම
- පාසලේ විනය බිඳවැටීම
- විවිධ අපචාර කෙරෙහි සිසුන් යොමු වීම
- ළමයා පාසලෙන් ගිලිහී යාම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# එක්සත් ජාතීන්ගේ සංවිධානය 1959 ප්‍රකාශනය

- අවම වශයෙන් ප්‍රාථමික අධ්‍යාපනයක් ලැබීමට ළමයාට අයිතිය ඇත
- එය අනිවාර්ය හා නිදහස් එකක් විය යුතු යි
- සමඅවස්ථා පදනම් කර ගත යුතු යි
- තම විභව්‍යතා දියුණු කර ගැනීමට අවස්ථාව දිය යුතු යි
- තනිව තීරණ ගැනීමට හැකියාව
- සමාජ වගකීම් අවබෝධයට
- සමාජයට අවශ්‍ය පුද්ගලයෙක් වීමට
- ජාති ආගම් භාෂා හෝ දේශපාලන මතය අනුව වෙනස් නොවිය යුතුයි
- අබල දුබලතා හෝ විශේෂතාවක් නොසැලකිය යුතු යි
- තමාට අහිතකර ඕනෑම අවස්ථාවක දී ඊට එරෙහිව නැගී සිටීමට අවස්ථාව ඇත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයාට අධ්‍යාපනයේ ඇති වැදගත්කම

- දිවි පැවැත්ම සඳහා ඉගෙනුම
- 1998 ඉගෙනුම ඔබ සතු වස්තුව
- 1998 යුනෙස්කෝ වාර්තාව
- 1945 කන්නන්ගර යෝජනා
  - නිදහස් අධ්‍යාපනය
  - මව්බසින් අධ්‍යාපනය
  - දිවා ආහාර වැඩසටහන
  - මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අවශ්‍යතා න්‍යාය (ඒබ්‍රහම් මාස්ලෝ)

ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතාව

රසික සම්භාවන අවශ්‍යතාව

පිළිවෙල, සුන්දරත්වය

ආත්ම සම්මානන අවශ්‍යතාව

අනුමැතිය, පිළිගැනීම ලැබීම

ස්නේහ අවශ්‍යතාව

ආදරය, පිළිගැනීම ලැබීම

ආරක්ෂක අවශ්‍යතා

කායික විද්‍යාත්මක අවශ්‍යතා

ආහාර, ජලය, වාතය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිග්මන් ෆ්‍රොයිඩ් ගේ මතය

- ළමා සංවර්ධන අවධි තුනක් දක්වයි
  - 1 පූර්ව ලිංගික අවධිය
  - 2 ගුප්ත ලිංගික අවධිය
  - 3 වෘද්ධ ලිංගික අවධිය

# 1 පූර්ව ලිංගික අවධිය

- උපතේ සිට අවුරුදු 1-2 දක්වා මුඛීය අවධිය
  - මුඛය මුල් කරගෙන සතුට ලබයි
  - උරාබීම හැපීම විකීම තලුගැසීම
  - තම හැඟීම් හා අදහස් පළකිරීමට මුකය භාවිත කරයි

- ගුද අවධිය (අ 02 සිට අ 06 දක්වා)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ජීන් පියාජේ ගේ බුද්ධි සංවර්ධන අවධි

1 ඉන්ද්‍රිය චාලක අවධිය (උපතේ සිට අ 02 දක්වා)

2 පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය( අ 02 සිට 07 දක්වා)

3 සංයුක්ත චින්තන අවධිය( අ 07 සිට 11 දක්වා)

4 විධිමත් චින්තන අවධිය (අ 12 සිට නව යොවුන් විය දක්වා)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1 ඉන්ද්‍රිය චාලක අවධිය (උපතේ සිට අ 02 දක්වා)

- කිරි ඉරීම
- යමක් අල්ලා ගැනීම
- ශබ්ද නිකුත් කිරීම
- යම් යම් ද්‍රව්‍ය හඳුනා ගනී
- ද්‍රව්‍ය අතර සම්බන්ධතාව තේරුම් ගනී
- ශබ්ද හා චලන අනුකරණය කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2 පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය( අ 02 සිට 07 දක්වා)

- භාෂාව හැසිරවිය හැකිය
- චර්යාවේ සංයුක්ත ස්වභාවය
- ප්‍රත්‍යාවර්ත චින්තන හැකියාව නැත
- ආත්ම කේන්ද්‍රීය ස්වභාවය
- එක් අවස්ථාවක දී එක් හේතුවක් පමණක් දකී
- සිද්ධියක සමස්තය දැකිය නොහැක
- සංරක්ෂණ සංකල්පය ඇත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 3 සංයුක්ත චින්තන අවධිය( අ 07 සිට 11 දක්වා)

- වර්ග කිරීමේ හැකියාව
- තර්කාණුකූලව සිතීම
- ද්‍රව්‍ය යම් පිළිවෙලකට සැකසීමේ හැකියාව
- ප්‍රමාණය බර පරිමාව තේරුම් ගැනීම
- ප්‍රත්‍යාවර්තන හැකියාව ඇත
- ආත්මකේන්ද්‍රීය චින්තනයෙන් මිදේ
- සංයුක්තව ගැටලු නිරාකරණය කර ගනී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 4 විධිමත් චින්තන අවධිය (අ 12 සිට නව යොවුන් විය දක්වා)

- තාර්කික චින්තනය පහළ වේ
- මුල් අවධියේ දී සංයුක්තව ගැටලු විසඳයි
- වාචික අභ්‍යුපගමනයෙන් ගැටලු විසඳයි
- වියුක්ත සංකල්ප ඉගෙනීමට හැකි ය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය කෙරෙහි ආරයේ සහ පරිසරයේ බලපෑම

- ආරය-
  - දෙමාපියන්ගෙන් උරුම කරගෙන එන ජීව විද්‍යාත්මක සාධක
  - මව හා පියා ගෙන් උරුම වන ජාන සම්බන්ධ වීමෙන් නිශ්චය වේ
  - පුද්ගලයන්ගේ කායික අංග ලක්ෂණ කෙරෙහි ආරය බලපායි
  - පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි ආරය බලපාන බව පර්යේෂණ සාක්ෂි දරයි
  - සමහර ලෙඩ රෝග ද ආරයෙන් ඇති වේ
  - බුද්ධි සංවර්ධනය කෙරෙහි ආරය තීව්‍ර ලෙස බලපාන බව අයිසෙන්ක් හා ආතර් ජෝන්සන් පවසයි
  - අනන්‍ය නිවුන් දරුවන් අතර බොහෝ දුරට සමාන බුද්ධි ඵලයක් ඇති බව නිව්මන් ප්‍රීමන් හා හොලිසින්ජර් පෙන්වා දී ඇත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය කෙරෙහි ආරයේ සහ පරිසරයේ බලපෑම

- පරිසරය-
  - අන්තර් සම්බන්ධතා ඇති කර ගන්නා ගතික ස්වභාවයෙන් යුත් උත්තේජක සියල්ල
  - බුද්ධිය ආරයේ ප්‍රතිඵලයක් ය යන මතය බ්‍රයන් සීමන් ප්‍රතික්ෂේප කරයි
  - ඔහු පවසන්නේ බුද්ධි සංවර්ධනය යනු පරිසරය හා සම්බන්ධ වූවක් බව යි
  - වුඩ්වර්ත් ගේ පර්යේෂණවලට අනුව අධ්‍යාපනික වෙනස්කම් බුද්ධියෙහි වෙනසක් ඇති කිරීම කෙරෙහි බලපායි
  - ආරයෙන් තීරණය වූ පුද්ගල ජීවිතය පරිසරයේ බලපෑමෙන් හැඩගැසේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1 දින සමාප්තිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය

- අංශ 4ක් යටතේ දක්විය හැක
  - ශාරීරික සංවර්ධනය
  - මානසික සංවර්ධනය
  - චිත්තවේගීය සංවර්ධනය
  - සමාජයීය සංවර්ධනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමා සංවර්ධනය පාසල් අවදීන් වශයෙන්

- පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා
- ප්‍රාථමික පාසල් අවධිය- අවුරුදු 05 සිට 11 දක්වා
- ද්වීතියික පාසල් අවධිය- අවුරුදු 11 සිට 18 දක්වා

# පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා

- කායික වර්ධනය
  - වැඩීම ළදරු වියේ මෙන් වේගවත් නැත
  - ස්නායු අස්ථි පේශි පරිනත වේ
  - කිරිදත් සියල්ල වැඩී ඇත
  - දිවීම පැනීම නැගීම හොඳින් කළ හැක
  - මොළය වැඩිහිටියකුට සාපේක්ෂව සියයට 90ක් පමණ වේ
  - ඉන්ද්‍රිය සමායෝජනය ක්‍රමයෙන් සිදු වේ
  - මෙම වර්ධනයට පෝෂණය ව්‍යායාම විවේකය නින්ද බලපායි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා

- බුද්ධි වර්ධනය
  - බුද්ධි වර්ධනය වේගවත් ය
  - භාෂාව වේගයෙන් වර්ධනය වේ
  - වාග් කෝෂය වචන 2000ක් පමණ වේ
  - කුතුහලයෙන් යුක්ත යි
  - නිතර ප්‍රශ්න කරයි
  - හොඳින් නිරීක්ෂණය කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා

- බුද්ධි වර්ධනය
  - ද්‍රව්‍ය හා අත්දැකීම් මත දැනුම ලබා ගනී
  - මනඃකල්පිත බව වැඩි ය
  - සංරක්ෂණ හැකියාව නැත
  - ප්‍රත්‍යවර්තී චින්තන හැකියාව නැත
  - සංජානනයට වහල් වේ
  - තර්කන හැකියාව නැත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා

- චිත්තවේගීය වර්ධනය
  - චිත්තවේග නිතර වෙනස් වේ
  - චිත්තවේග පාලනය අපහසු ය
  - මානසික අවශ්‍යතා ඉටු වීම තුලින් චිත්තවේග වර්ධනය වේ
  - දරුවා හදා වඩා ගන්නා ක්‍රමය හා පරිසරය එයට බලපායි
  - චිත්තවේගීය වශයෙන් වෙහෙසකර අවධියකි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙර පාසල් අවධිය- අවුරුදු 02 සිට 05 දක්වා

- සමාජයීය වර්ධනය
  - පවුලේ සමාජිකයන් සමග පවත්වන අන්තර් සබඳතා වැදගත් වේ
  - සමාජයේ වෙසෙන අය සමග අන්තර් සබඳතා අනතුරුව වැදගත් වේ
  - සංස්කෘතිය ද වැදගත් වේ
  - දෙමාපියන්ගේ සැලකිල්ල අනුව සදාචාර සිරිත් විරිත් අනුගමනය කරයි
  - මිතුරන් සමග සුළු වේලාවක් සෙල්ලම් කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රාථමික පාසල් අවධිය (අවුරුද් 5-11)

- කායික වර්ධනය
  - වර්ධනය අඛණ්ඩ යි
  - පෙරමෙන් වේගවත් නැත
  - අත් පාවල වැඩි වර්ධනයක් ඇත
  - විශේෂයෙන් පාදවල වර්ධනය වැඩි ය
  - උස බර වැඩි වේ
  - ස්නායු පේශි අස්ථි තව දුරටත් වර්ධනය වේ
  - සිරුරේ නියම හැඩය ඇති වේ
  - ඉන්ද්‍රිය සමායෝජනය දියුණු වේ
  - සංකීර්ණ චාලක ක්‍රියා කළ හැකි ය
  - කිරිදත් වැටී ස්ථිර දත් එයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රාථමික පාසල් අවධිය (අවුරුද් 5-11)

- බුද්ධි වර්ධනය
  - සංකල්ප සාධනයට යොමු වේ
  - ඒ සඳහා ඉන්ද්‍රියයන් හා ද්‍රව්‍ය මුල් කරගත් ක්‍රියාකාරකම් උපයෝගී වේ
  - සංරක්ෂණ සංකල්පය ක්‍රමයෙන් වර්ධනය වේ
  - ප්‍රත්‍යවර්ති චින්තන හැකියාව වර්ධනය වේ
  - වියුක්ත දේ ගැන තර්කානුකූලව සිතිය නොහැක
  - කුතුහලය ඇත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රාථමික පාසල් අවධිය (අවුරුද් 5-11)

- චිත්තවේගීය වර්ධනය
  - සැහෙන දුරට චිත්තවේග පාලනය කළ හැකි ය
  - සාපේක්ෂව චිත්තවේගික වශයෙන් සන්සුන් අවධියකි
  - මානසික අවශ්‍යතා ඉටු වීම මත චිත්තවේගික තත්වය රඳා පවතී
  - පාසලේ බලපෑම වැඩි ය
  - ආදරය පිළිගැනීම සුරැකියාව තව දුරට ත් බලාපොරොත්තු වේ
  - වැඩිහිටි අනුමැතිය අපේක්ෂා කරයි
  - අන්‍යොන්‍ය ගෞරවයක් වැඩිහිටියන් ගෙන් අපේක්ෂා කරයි
  - දඬුවම් තහංචි සුදුසු නැත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රාථමික පාසල් අවධිය (අවුරුදු 5-11)

- සමාජයීය වර්ධනය
  - පවුල පාසලට අමතරව සමවයස් මිතුරන් බලපායි
  - රුචිකම් මත මිතුරු කණ්ඩායම් ඇති වේ
  - මිතුරු කණ්ඩායම් තාවකාලික ය
  - ගැහැණු පිරිමි වෙන් වෙන්ව කණ්ඩායම් වේ
  - කණ්ඩායම් තුළින් නායකත්වයට සාමූහිකත්වයට සහයෝගයට හුරු වේ
  - සදාචාරයට ක්‍රමයෙන් හුරු වේ
  - පොදු හැගීම් ස්ථිර කණ්ඩායම් බිහි වන්නේ ක්‍රමයෙනි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ද්විතියික පාසල් අවධිය- අවුරුදු 11 සිට 18 දක්වා

- කායික වර්ධනය
  - වර්ධනය වේගවත් ය
  - බාහුවල හා කඳේ වැඩි වර්ධනයක් ඇත
  - උස බර වැඩිවේ
  - ද්විතීයක ලිංගික ලක්ෂණ පහලවේ
  - ගැහැණු ළමුන් සාපේක්ෂව කල් ඇතිව පරිනත වේ
  - ශරීරය වැඩහිටි ස්වභාවය ගනී
  - නිර්නාල ග්‍රණ්ථිවල ක්‍රියාකාරිත්වය ඇති වේ
  - ලිංගේද්‍රිය වර්ධනය සීඝ්‍ර ය
  - ප්‍රජනන හැකියාව ලැබේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ද්විතියික පාසල් අවධිය- අවුරුදු 11 සිට 18 දක්වා

- බුද්ධිමය වර්ධනය
  - සංකල්ප වර්ධනයේ දියුණු අවධිය යි
  - වියුක්ත චින්තන හැකියාව ඇතිවේ
  - කල්පිත ගොඩනැගීමේ හැකියාව ඇතිවේ
  - විද්‍යාත්මක මෙන්ම වියුක්ත හා න්‍යායාත්මක ප්‍රශ්න විසඳීමේ හැකියාව ඇතිවේ
  - නව අර්ථකථන දක්වයි
  - ආගම දර්ශනය ආදියේ ගැඹුරු සංකල්ප ද තේරුම් ගනී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ද්විතියික පාසල් අවධිය- අවුරුදු 11 සිට 18 දක්වා

- චිත්තවේගික වර්ධනය
  - ශාරීරික වර්ධනය ආශ්‍රිත චිත්තවේගික ගැටළු ඇතිවේ
  - නිදහස පරමාදර්ශ ලිංගික ලැදියා ආදිය මත වැඩිහිටියන් සමග චිත්තවේගිකගැටුම් ඇතිකර ගනී
  - තම ශාරීරික වෙනස ගැන ලජ්ජාව කුතුහලය ඇති කර ගනී
  - තම රූප සොභාව පෙනුම පිරිසිදුකම ගැන වඩාත් සැලකිලිමත් වේ
  - ළමා වියත් වැඩහිටි වියත් අතර අතරමං වූ බවක් දැනේ
  - තව දුරටත් වැඩිහිටි ආරක්ෂාව ආදරය පතයි

# ද්විතියික පාසල් අවධිය- අවුරුදු 11 සිට 18 දක්වා

- සමාජයීය වර්ධනය
  - සමවයස් කණ්ඩායම් ඇසුර බලවත් වේ
  - විරුද්ධ ලිංගික ඇසුර ප්‍රිය කරයි
  - ගැහැණු පිරිමි මිශ්‍ර කණ්ඩායම් ඇතිවේ
  - පොදු හැගීම් පරමාදර්ශී බව වීරත්වය තදාත්මීකරණය දක්නට ලැබේ
  - අන්‍යොන්‍ය ගරුත්වය අපේක්ෂා කරයි
  - පවතින දුර්වලතා විවේචනය කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශිෂ්‍යයා හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණ

- නිරීක්ෂණය
- සාධන පරීක්ෂණ
- වාචික පරීක්ෂණ
- සම්මුඛ පරීක්ෂණ
- ප්‍රත්‍යවේක්ෂණ වාර්තා
- ප්‍රත්‍යක්ෂ අධ්‍යයන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විශේෂ අවශ්‍යතා ඇති ළමුන්

## ආබාධිත

1 කායික ආබාධිත

2 මානසික(ඉගෙනුම්) ආබාධිත

3 මානසික රෝග

## සුහග

විශේෂ දක්ෂතා ඇති

## චර්යා අක්‍රමතා ඇති

1 දුස්සමාහිත

2 අපචාරී

# ආබාධිත

## කායික ආබාධිත

1 දෘශ්‍යාබාධිත

2 ශ්‍රව්‍යාබාධිත

3 කථනාබාධිත

4 අංගවිකල

## ඉගෙනුම්ආබාධිත

මන්දමානසික

ඉගෙනුම් ආබාධිත

## මානසික රෝග

නිව්රෝෂියා

සයිකෝෂියා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# දෘශ්‍යාබාධිත සිසුන්ගේ ලක්‍ෂණ

- කියවීමේ දී හා ලිවීමේ දී පොත ළඟට ඇස ගෙනයාම හෝ ඇත් කිරීම
- ළඟ සිටින සිසුවාගේ පොත බලා ලිවීම
- කළු ලෑල්ලේ ලියූ දේ පිටපත් කර ගැනීමට අපහසුව
- කළුලෑල්ල අසලටම ගොස් බැලීම
- ඇස් කුඩා කිරීම/ලොකු කිරීම/කඳුළු ගැලීම
- නිතර හිසරදය
- ලොකු අකුරු ලියයි
- පිල්ලම් අඩුව ලියයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරුවරයා කළ යුතු දේ

- දෙමාපියන් හෝ භාරකරුවන් දැනුවත් කිරීම
- ඇස්කණ්ණාඩි ලබා ගැනීමට යොමු කරන්න
- ඉදිරිපේලියක වාඩි කරන්න
- පොත් කියවීම හා ලිවීම පිළිබඳව නිතර සොයා බලන්න
- ශිෂ්‍ය අභිමානය ගොඩනගන්න

# ශ්‍රවයාබාධිත සිසුන්ගේ ලක්‍ෂණ

- හැමවිටම අවධානයෙන් තොරව පසුවේ
- අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමට නිතරම අපොහොසත් වේ
- ප්‍රශ්න ඇසීමේ දී හෝ විස්තර කිරීමේ දී ගුරුවරයාට නැවත නැවතත් කියවීමට සිදුවේ
- කතාබහේ දී නෑසෙන බව නිතර අඟවයි
- යම් අයෙකු විසින් අමතනු ලැබූවිට නිතර නළල රැළි ගන්වයි ශබ්රය ඉදිරියට නමා ආයාසයෙන් සවන් දෙයි
- හිස පසෙකට හරවා එක් කණක් කතා කරන අය දෙසට යොමු කරයි
- යම් ශබ්දයක් එන්නේ කිනම් දිහාවකින්ද යන්න කීමට අපොහොසත් ය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ශ්‍රවණාබාධිත සිසුන්ගේ ලක්‍ෂණ

- ළඟ සිටින සිසුවාගේ පොත බලා ලියයි
- කලින් අසා නැති වචන වැරදි ලෙස උච්චාරණය කරයි
- උස් හඬින් හෝ දුර්වල හඬින් කතා කරයි
- කණ් දෙක ඇතුලේ ඇසෙන ශබ්දයක් ගැන නිතර පැමිනිලි කරයි
- කණ්ඩායමෙන් ඉවත් වී හුදෙකලාව සිටී
- අවට සිදු වන දේ ගැන උනන්දුවක් නැත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරුවරයා කළ යුතු දේ

- දෙමාපියන් දැනුවත් කරන්න
- ඉදිරිපේළිවල වාඩි කරවන්න
- කතා කරනවිට තොල් සෙලවෙන ආකාරය දකින්නට ඉඩසලස්වන්න
- දෘශ්‍යාධාර වැඩිපුර භාවිතා කරන්න
- අනෙක් ගුරුවරුන් දැනුවත් කරන්න
- වෛද්‍ය උපදෙස් සඳහා යොමු කරන්න

# කථන ආබාධිත ළමුන්ගේ ලක්ෂණ

- යම් අක්ෂරයක් වෙනුවට වෙනත් අක්ෂරයක් භාවිතා කරයි
  - උදා- **රතු - තතු** **මට - මත**
- වචන උච්චාරණයේ දී ඇතැම් ශබ්ද ගිලිහේ (උදා- **අශ්වයා- අවයා**)
- ඇතැම් වචනවලට අමුතුවෙන් ශබ්ද එකතු කරයි( **සමනලයා-සලමලයා**)
- ඇතැම් වචන විකෘති කරයි( **කොළඹ-කොඹල/ වලහා-වහලා**
- කථා විලාසය පැහැදිලි නැත/ මුමුණයි/ අන් අයට නෑසේ
- වචනයක මුල් අකුර පුනපුනා කියයි(**ග-ග්-ගස/ ත-තත්-තාරාවා**)
- කොපමණ වෑයම් කළත් ශබ්දයක් පිට නොවේ
- කථා කරන විට තදින් ඇසිපිය හෙළයි
- වචනවල එන **ස**/ **ෂ** හා **ද**/ **හ**/ **බ** වැනි මහප්‍රාණ අක්ෂර වරදවා උච්චාරණය කරයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ඩිස්ලෙක්ෂියාව

- කායික මානසික වර්ධනයේ ගැටලුවක් නැත
- බුද්ධිමය අඩුපාඩුවක් නැත
- අකුරු හා වචන භාවිතා කර කියවීමේ දුබලතා දක්වයි
- අනවධානය හා අමතක වීම
- හොඳින් දන්නා වචන පවා උච්චාරණයට බොහෝ වෙලා ගැනීම
- අනුමානයෙන් වැරදි ලෙෂ වචන කීම
- අකුරු හැඩ සංජානනය නොවීම
- විකෘති අකුරු හැඩ/අකුරු කැලි ලියයි/අකුරු අතහැර ලියයි
- අර්ථය අවබෝධ නොවේ
- කියවීම ඉතා දුර්වල යි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරුවරයා කළ යුතු දේ

- මෙවැනි ළමයින් හඳුනා ගන්න
- සුවිශේෂ ක්‍රමවේද තුලින් දරුවාට ළඟා වන්න. විශ්වාසය දිනා ගන්න
- නිර්මාණශීලී ක්‍රියාකාරකම් ඇතුලත් පැවරුම්පත් සකස් කරන්න
- ළමයින්ගේ ප්‍රබලතා මතු කර ගන්න
- ළමයින් අගයන්න
- කොන් නොකිරීමට වග බලා ගන්න
- කළ හැකි බව නිතර ඒත්තු ගන්වන්න

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ඉගෙනුම් ආබාධිත බවට හේතු

- කායික විද්‍යාත්මක වෙනස්කම්
- ගෘහාශ්‍රිත සාධක
- භාෂා දුබලතාවය
- දොස්/චෝදනා/විහිලු/අවඥාවට ලක් වීම
- කායික හෝ මානසික දඩුවම් නිසා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරුවරයා කළ යුතු දේ

- මෙම ළමයින්ගේ දක්සතාවට සරිලන හැකියාවක් පමණක් බලාපොරොත්තු වන්න
- ශ්‍රේණිය ගැන නොසලකා සිසුවාට ගැලපෙන වැඩ වෙනම සැලසුම් කරන්න
- ප්‍රතිකාර්ය ඉගැන්වීම් කරන්න
- ඒ පිළිබඳව විදුහල්පති දෙමාපියන් දැනුවත් කරන්න
- දක්ෂතා අගය කරන්න
- ප්‍රසංශා කරන්න
- අසමත් නොකරන්න

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සුභග ශිෂ්‍යයා



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සුභග ශිෂ්‍යයා

- බුද්ධි ඵලය 130 ට වැඩි යි
- ඉතා වේගයෙන් හා පහසුවෙන් උගනී
- සහජ බුද්ධිය හා ප්‍රායෝගික දැනුම බොහෝ සෙයින් උපයෝගී කර ගනී
- තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරයි
- පැහැදිලිව හිතයි
- සම්බන්ධතා හා අරුත් පහසුවෙන් අවබෝධ කරගනී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සුභග ශිෂ්‍යයා

- හොඳ ධාරණ ශක්තියක් ඇත
- පන්තියේ අනෙක් ළමුන් නොදන්නා බොහෝ කරුණු දන සිටී
- සංකීර්ණ මානසික ක්‍රියාකාරකම්වල යෙදේ
- බොහෝ සෙයින් ප්‍රශ්න විචාරයි
- නිර්මාණශීලී චින්තන රටාවක් ඇත
- නිතර විමසිලිමත්ව සිටී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරු කාර්ය භාරය

- පන්තියේ භෞතික පරිසරය සකස් කිරීම
  - විද්‍යා මුල්ල
  - ගණිත මුල්ල
  - බිත්ති පුවත්පත
- පන්ති පුස්තකාලය
  - විවිධ මට්ටමට ගැලපෙන පොත්
  - නිර්මාණාත්මක චින්තනය අවදිකරන පොත්
- ඉගෙනුම් ආධාරක භාවිතය
- විශේෂ පැවරුම්
- විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිතය
- විශේෂ ව්‍යාපෘති ලෙස සුභග සිසුන් ප්‍රවර්ධනය කිරීම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# දුෂ්සමාහිත ළමුන්



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සාමාන්‍ය දුෂ්සමාහිත ළමුන්ගේ ලක්ෂණ

- යම් කාර්යයක් කිරීමට උනන්දු කරවීමට ගුරුවරයාට වෙහෙස දැරීමට සිදුවේ
- සාවධානව ඇහුම්කන් නොදේ/ මන්දෝත්සාහීය/කම්මැලි ස්වභාවය
- සිතේ අසහනය දක්වෙන ඉඟි පළකරයි(ඇඟිලි ඉරීම/නිය විකීම/ගොත ගැසීම)
- අවස්ථාව ලැබුණු හැම විටම පන්තියේ ළමුන් විසින් කොන් කරනු ලබයි
- පැහැදිලි හේතුවක් නොමැතිවම පරාජිතයකු බවට පත් වේ
- නිතර පාසල් නොපැමිණේ/පාසල තදින් අප්‍රිය කරයි
- අන් ළමුන්ට සාපේක්ෂව දුර්මුඛ යි
- තම සහජ හැකියාවන්ට වඩා අඩු සාධන මට්ටමක් පෙන්වයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# දුෂ්සමාධානයෙන් පෙළෙන සිසුන්ට උපකාරී වීම

- සිසුන් හඳුනා ගැනීම හා අවබෝධ කර ගැනීම
- පන්තියේ යහපත් වාතාවරණයක් ඇති කිරීම
- පන්තියෙ යහපත් සමාජමය පැවතුම් රටාවක් ඇති කිරීම
- විවිධ ඉගැන්වීමේ ක්‍රම භාවිතය
- පන්ති විනය රැකීම

# මන්දගාමීව ඉගෙන ගන්නා ළමුන්



# මන්දගාමීව ඉගෙන ගන්නා ළමුන්ගේ ලක්ෂණ

- වියුක්ත චින්තනයේ අසමත් ය
- ගුරුවරයා දෙන උපදෙස් වටහා ගැනීමට/අනුගමනය කිරීමට අසමත් ය
- අවස්ථානුකූලව කටයුතු කිරීමේ සාමාන්‍ය බුද්ධිය නැත
- සංකීර්ණ ක්‍රීඩා නීති රීති අවබෝධ කර ගැනීම අපහසු ය
- ශාස්ත්‍රීය සමාජමය චිත්තවේගීය හා කායික යන හැම අංශයකින්ම පසුබැම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මන්දගාමීව ඉගෙන ගන්නා ළමුන්ගේ ලක්ෂණ

- විනය නීති හා ක්‍රීඩා නීති උල්ලංඝනය කරයි
- ස්වශක්තියෙන් ක්‍රියාකාරකම්වල යෙදීමට අපොහොසත් ය
- පහස්වෙන් චිත්ත වික්ෂිප්ත භාවයට පත් වේ
- යම් කාර්යයක් කෙරෙහි දක්වන උනන්දුව හා අවධානය කෙටි කාලීන ය
- පන්තියේ පොදු සාධන මට්ටමට වඩා පසුපසින් සිටී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# හෙමින් ඉගෙනගන්නා සිසුන්ට උපකාරි වීම

- සිසුන් අවබෝධ කර ගැනීම
- පන්ති වාතාවරණය ගැලපෙන පරිදි සැකසීම
- ගැලපෙන ක්‍රියාකාරකම් ලබා දීම
- ඉගැන්වීමේ ක්‍රමවේද ගැලපෙන ලෙස සැකසීම
- සුදුසු ශ්‍රව්‍ය දෘශ්‍යාධාර භාවිතය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සමාප්තිය